# විශ්වවිද්‍යාල සිසුන් තොරතුරු අවශ්‍යතා සාධනය සඳහා ජංගම දුරකථන භාවිතය පිළිබඳ අධ්‍යයනයක්:කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ඒ. එම්. අයි. පී. කරුණාසේන** [1]
**කේ. ඒ. ටී. චාමර** [2]

**සංක්ෂේපය**

ලෝකයෙහි වෙනස් වන සමාජ, ආර්ථික, දේශපාලන, සංසිද්ධි පදනම් කරගෙන බිහි වන තොරතුරු ජනතාව කරා ගෙන යනු ලබන ප්‍රධාන වාහකයා වන්නේ තොරතුරු සන්නිවේදන මාධ්‍යන්ය. තොරතුරු සන්නිවේදන මාධ්‍ය අතුරින් පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය හා සාපේක්ෂව නව මාධ්‍ය මෙවලමක් ලෙස ජංගම දුරකථනය සඳහා වැදගත් ස්ථානයක් වර්තමානයේ හිමි වී ඇත. දිනෙන් දින තාක්ෂණික වශයෙන් නව ඉසව් කරා ගමන් කරනා දුරකථනය තොරතුරු සන්නිවේදන ක්ෂේත්‍රය තුළ ප්‍රබල බලපෑමක් සිදු කිරීමට සමත්ව ඇත.

මෙම පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ වන්නේ විශ්වවිද්‍යාල සිසුන් තොරතුරු අවශ්‍යතා සාධනය කර ගැනීම සඳහා ජංගම දුරකථන කොතෙක් දුරට භාවිත කරන්නේ ද යන්න අධ්‍යයනය කිරීමය. වර්තමානයේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව ගත් කල ජංගම දුරකථන භාවිත නොකරන්නෙක් සොයා ගැනීම උගහටය. ජංගම දුරකථනය යනු විශ්වවිද්‍යාල ප්‍රජාවගේ අනිවාර්ය අංගයක් බවට පත් වී ඇත. එසේ වුවද ඔවුන් තොරතුරු සන්නිවේදන මාධ්‍යක් ලෙස ජංගම දුරකථනය මඟින් ලැබෙන්නා වූ ප්‍රයෝජන අයත් කර ගන්නේද යන්න ගැටලුවක්ව පවතී. මෙම පර්යේෂණය සඳහා සරල සසම්භාවී නියැඳි ක්‍රමය යටතේ සමාජයීය විද්‍යාව, මානව ශාස්ත්‍ර, වානිජ හා කළමනාකරණ, විද්‍යාව යන පීඨයන්හි විශේෂ උපාධිය හදාරන අවසන් වසර සිසුන් 244 ක් අතරේ ප්‍රශ්නාවලී බෙදා හැරීම මඟින් දත්ත රැස් කර ගන්නා ලදී.

නියැදිය ලෙස තෝරාගත් විශ්වවිද්‍යාල ප්‍රජාව අතුරින් සියලුම දෙනා ජංගම දුරකථන භාවිත කරනු ලැබේ. ඔවුන් අතුරින් වැඩි පිරිසක් Smart phone භාවිත කරයි. ජංගම දුරකථන භාවිත කරන්නන්ගේ ප්‍රතිශතය ඉහළ අගයක් ගත්තද තොරතුරු අවශ්‍යතා සඳහා ජංගම දුරකථන භාවිත කරන්නන්ගේ ප්‍රමාණය පහළ අගයක් ගනී. මොවුන් වැඩි පිරිසක් ජංගම දුරකථනය හරහා අන්තර්ජාලය භාවිත කරනු ලබන අතර එයිනුත් වැඩි ප්‍රමාණයක් විනෝදාත්මක අරමුණු සඳහා අන්තර්ජාලය භාවිත කරයි. සමස්තයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ ජංගම දුරකථනය සන්නිවේදන කාර්යයන්, කාලීන තොරතුරු හා විනෝදාත්මක අරමුණු සඳහා භාවිත කිරීමේ වැඩි ප්‍රවණතාවක් හඳුනා ගත හැකි වුවද ඊට සාපේක්ෂව ශාස්ත්‍රීය තොරතුරු ගවේෂණය සඳහා දක්වන අවධානය අවම මට්ටමක පවතින බව නිගමනය විය.

මෙහිදී යෝජනා වශයෙන් තොරතුරු ලබා ගැනීමේ සමීපතම මාධ්‍යක් ලෙස ජංගම දුරකථනයෙහි ඇති වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබාදීම, අධ්‍යාපනික අවශ්‍යතා සපුරා ගැනීමේදී විශේෂයෙන් දුරස්ථ අධ්‍යාපනික කාර්යයේදී ජංගම දුරකථනයෙහි ඇති වැදගත්කම පිළබඳව දැනුවත් කිරීම පෙන්වා දිය හැකිය. මෙම යෝජනා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම තුළින් තොරතුරු අවශ්‍යතා සාධනය කර ගැනීම සඳහා ජංගම දුරකථනය මඟින් ප්‍රබල දායකත්වයක් ලබා ගත හැකිවනු ඇත.

**ප්‍රමුඛ පද :- ජංගම දුරකථනය, තොරතුරු අවශ්‍යතාවය, විශ්වවිද්‍යාල සිසුන්**

1. *පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* imeshakaru10@gmail.com

2. *පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* chamara@kln.ac.lk